# සීක් දහමේ ආරම්භය හා විකාශය

ඊ.ඩබ්ලිව්.ඒ.එච්.සී. ගුණසිංහ*

**සංක්ෂේපය**

දහසයවන සියවසේදී පංජාබයේ විසූ ගුරු නානක් දේව් විසින් පංජාබයේ හින්දූන් හා මුස්ලිම්වරු අතර සංහිඳියාවක් ඇතිකිරීමේ අරමුණින් බිහිකළ දහම සීක් දහම නම් වේ. ඒ සඳහා පදනම සැකසුනේ හින්දු ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයක් වූ භක්තිවාදයෙනි. ආගමික ගුරුවරයකු යටතේ නිශ්චිත ප්‍රතිපදාවකට අනුව ජීවත් වීම ආගමේ මාර්ගය විය යුතු යැයි ගුරු නානක් විශ්වාස කළ අතර ඒ අනුව කටයුතු කළ ඔහුගේ අනුගාමිකයන් හඳුන්වන ලද්දේ 'ශීඛ්/සීක්' (ශිෂ්‍යයන්) යන නමිනි. ගුරු නානක් විසින් ඇතිකරනු ලැබූ පදනම ඔස්සේ පසුව ගුරු අංගද් දේව්, ගුරු අමර්දාස්, ගුරු රාම්දාස්, ගුරු අර්ජන් දේව්, ගුරු හර් ගෝබින්ද්, ගුරු හර් රායි, ගුරු හර් කිෂන්, ගුරු තේජ් බහදූර් සහ ගුරු ගෝබින්ද් සිං යන සීක් ගුරුවරු තවදුරටත් සීක් දහම ප්‍රවර්ධනය කිරීමට කටයුතු කළහ.

ඒ අනුව මෙම පර්යේෂණයේ අරමුණ වූයේ ගුරු නානක් දේව්ගේ පටන් ගුරු ගෝබින්ද් සිං දක්වා වූ කාලවකවානුව තුළ සීක් දහම විකාශනය වූ අන්දම පිළිබඳ අධ්‍යයනය කිරීමයි. එහිදී අධ්‍යයන ගැටලුව බවට පත්වූයේ එක් එක් සීක් ගුරුවරයාගේ කාලය තුළ සීක් දහමට එක් වූ නව අංග කවරේද යන්න සොයාබැලීමයි. සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනය කිරීම අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් මෙහිදී භාවිත කෙරිණි.

සීක්වරුන් උදෙසා 'ආදි ග්‍රන්ථ් සහීබ්' නමින් පූජනීය ග්‍රන්ථයක් සැකසීම ඇතුළුව නව ආගමික චාරිත්‍ර වාරිත්‍ර ඇතිකිරීම ආදී කාර්යය රැසක් සිදුකෙරුණේ ඉහත සඳහන් ගුරුවරුන් අතිනි. අවසාන සීක් ගුරුවරයා වූ ගුරු ගෝබින්ද් සිංගෙන් අනතුරුව සීක්වරුන්ගේ පූජනීය ග්‍රන්ථය වූ ආදි ග්‍රන්ථ් සහිබ් වෙත ගුරු ධූරය පැවරුණු අතර අද දක්වාම සීක්වරුන්ගේ චරිත හැඩගැස්වීම සඳහා එකී ග්‍රන්ථයෙන් ලැබෙන්නේ අනගි පිටුබලයකි.

මුල් කාලසීමාවේදී අවිහිංසාවාදය පිළිගත් ජන වර්ගයක් වූ සීක්වරුන් පසුව රණකාමී ජනවර්ගයක් බවට පරිවර්තනය වීමට හේතු වූයේ ඔවුන්ට මෝගල් පාලකයන්ගෙන් එල්ල වූ ආක්‍රමණයි. මෙකී රණකාමීත්වය සඳහා නිවැරදි අධ්‍යාත්මික මග පෙන්වීමක් ලබාදීමට අවසන් සීක් ගුරුවරයා වූ ගුරු ගෝබින්ද් සිං විසින් කටයුතු කරනු ලැබුවේ 'ඛල්සාව' නම් චාරිත්‍රය හඳුන්වා දෙමිනි.

## හැඳින්වීම

ඉන්දියාවේ පංජාබ් ප්‍රදේශය නිජබිම කොටගෙන ලොව පුරා ව්‍යාප්තව සිටින සීක් දහම පිළිපදින ජනතාව සීක්වරුන් නමින් වෙනම ජනවර්ගයක් වශයෙන් පෙනී සිටියි. වසර හයසියයක පමණ ඉතිහාසයකට උරුමකම් කියන සීක් දහම බිහිවීම සඳහා පදනම වැටුණේ හින්දු ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයක් වශයෙන් ක්‍රියාත්මක වූ භක්තිවාදයෙනි. දෙවියන්

* *තාවකාලික කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයන අංශය,* hachagu@gmail.com/ hasithac@kln.ac.lk

කෙරෙහි අවනත භාවය දක්වීම තුළින් පුද්ගල ආත්මය නොපෙනී ගොස් දෙවියන් කෙරෙහි බැඳී සිටිනු ඇතැයි පිළිගැනුණු භක්තිවාදයේ ප්‍රධාන අරමුණ වූයේ කුලය, වර්ගය, වර්ණය ආදී පටු භේද පසෙකලා විශ්ව සාධාරණ සහෝදරත්වයක් ඇතිකිරීමයි (*The New Encyclopaedia Britannica Vol. 27*, 2010:284). භක්තිවාදී සංකල්ප අටවන සියවසේ පමණ පටන් දකුණු ඉන්දියාවේ ඇතිව තිබුණ ද, එය ජනප්‍රියත්වයට පත්වූයේ එකොළොස්වන හා දොළොස්වන සියවස්වලදී ය. ඒ සඳහා බලපෑවේ ඉන්දියාව තුළ ක්‍රමයෙන් පැතිර ගිය ඉස්ලාම් ධර්මයෙන් ඉගැන්වුණු කුලභේදය පිටුදැකීම, නිරර්ථක යාඥ විධි ප්‍රතික්ෂේප කිරීම ආදී කරුණු අගය කළ බොහෝ හින්දූන් ඉස්ලාම් ධර්මය වැළඳගැනීමට කටයුතු කිරීම ය. ඒ නිසා හින්දූන් ආගම තුළ රඳවා තබාගැනීම සහ ප්‍රධාන හින්දු නිකායද්වය වූ වෛෂ්ණව නිකාය හා ශෛව නිකාය අතර පැවති පරතරය නැති කිරීම භක්තිවාදයේ මූලික පරමාර්ථ බවට පත්ව තිබිණි (පින්තු, 2002:169-170).

මෙහිදී භක්තිවාදීන් විසින් අනුගමනය කරනු ලැබුවේ එක් දෙවියෙකු පිළිබඳ විශ්වාස කිරීම, ඒ දෙවියන් වෙත භක්තිය දක්වමින් නිරර්ථක ආගමික පුද පූජා ආදියෙන් බැහැරවීම සහ ආගමික ආචාර්යවරයකු ඇසුරුකරමින් දෙවියන් උදෙසා සිය ආත්මය කැප කිරීම යන ක්‍රියාපිළිවෙතයි. ශාන්තුවරුන් වශයෙන් පිළිගැනුණු දාර්ශනිකයන් රැසක් භක්තිවාදය තුළ දැකගත හැකි අතර ඉන් අග්‍රතමයා වශයෙන් පිළිගැනෙන්නේ කබීර් නම් දාර්ශනිකයා ය. සීක් දහමේ නිර්මාතෘ මෙන්ම පළමු ගුරු වශයෙන් සැලකෙන ගුරු නානක් දේව් පිළිගැනෙන්නේ ද භක්තිවාදයේ එන ශාන්තුවරයෙකු වශයෙනි (පින්තු, 2002:170-172).

**සීක් දහමේ ආරම්භය**

මධ්‍යකාලීන ඉන්දියාවේ ජීවත් වූ ආගමික හා සමාජ ප්‍රතිසංස්කාරයෙකු වූ ගුරු නානක් දේව්ගේ (1469-1539) ඉගැන්වීම් පාදක කොටගෙන බිහිවූ සීක් දහම ක්‍රියාත්මක වූයේ හුදෙක් ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයක් වශයෙන් පමණක් නොව පංජාබයේ හින්දු මුස්ලිම් දෙකොට්ඨාශය අතර සමඟිය ඇතිකරලීමේ අරමුණ ද පෙරදැරි කොටගෙන ය. ගුරු නානක්ට අනුව ආගමේ මාර්ගය යනු අදහස් හා න්‍යාය රැසක එකතුවක් නොව කිසියම් ආගමික ගුරුවරයෙකු යටතේ නිශ්චිත ප්‍රතිපදාවන් සමූහයක් අනුගමනය කරමින් ජීවත් වීමයි. ඒ අනුව නිශ්චිත ප්‍රතිපදාවන් සමූහයක් අනුගමනය කරමින් ගුරු නානක් යටතේ ජීවත් වූ අනුගාමිකයන් පිරිස ප්‍රකට වූයේ 'ශීඛ්/සීක්' (ශිෂ්‍යයන්) යන නාමයෙනි (පින්තු, 2002:172).

වත්මන් පාකිස්ථානයේ බටහිර පංජාබ්යේ තල්වන්ඩ්හි (අද එම ප්‍රදේශය 'නන්කානා සහීබ්' යන නමින් හැඳින්වෙන්නේ ගුරු නානක්ට කෙරෙන ගෞරවයක් වශයෙනි) වර්ෂ 1469 අප්‍රේල් 15 වනදා උපත ලැබූ ගුරු නානක් දේව් කුඩා කළ හැඳින්වූයේ නානක් රායි යන නමිනි. ඉගෙනීමේ අති දක්ෂයෙකු වූ ඔහු සංස්කෘත හා පර්සියන් භාෂාවලට සුවිශේෂී හැකියාවක් දැක්වූවා පමණක් නොව ගායනයට ද විශේෂ දක්ෂකමක් දක්වා තිබුණි. යොවුන් වියට එළඹි නානක් උසස් කුලවල පිරිමි දරුවන් උදෙසා නිසි වයස එළඹීමෙන් පසුව පවත්වනු ලබන 'උපනයනය' නම් වූ පූන නූල පැළඳවීමේ හින්දු චාරිත්‍රය පවා ප්‍රතික්ෂේප කළ බව කියැවේ. අනතුරුව පවුලේ ව්‍යාපාර කටයුතුවලට සම්බන්ධ වීම ද ප්‍රතික්ෂේප කළ

නානක් සත්‍ය ඥානය සොයාගෙන යෑමට උත්සුක වෙමින් බොහෝ විට කාලය ගතකළේ භාවනාවේ යෙදෙමිනි (*The New Encyclopaedia Britannica Vol. 27*, 2010:284).

නානක්ගේ ක්‍රියාපිළිවෙත පිළිබඳ සැක උපදවා ගත් නානක්ගේ පියා තම පුත්‍රයා බ්‍රහ්මචාරී දිවියකට යොමුවෙතැයි යන බියෙන් ඔහුට විවාහයක් කරදුන්න ද, ඉන් නානක් අනුගමනය කළ ජීවන රටාවේ කිසිදු වෙනසක් සිදු නොවිණි. වරක් ව්‍යාපාර කටයුතු සඳහා නානක්ගේ පියා ලබාදුන් මුදල්වලින් දුප්පතුන්ට ආහාර ලබාදීමට නානක් කටයුතු කළ හෙයින් ඒ පිළිබඳ පියා අතිශය කෝපයට පත්විය. මෙනිසා නානක්ගේ සොයුරියගේ ස්වාමිපුරුෂයා විසින් නානක්ට සුල්තාන් දෞලාත් ඛාන්ගේ ධාන්‍යාගාරයේ රැකියාවක් ලබාදෙනු ලැබුවේ ඔහුව නිවැරදි කරගැනීමේ අපේක්ෂාවෙනි (*The New Encyclopaedia Britannica Vol. 27*, 2010:284).

සුල්තාන් දෞලාත් ඛාන්ගේ ධාන්‍යාගාරයේ සේවය කරමින් සිටි නානක් වර්ෂ 1507 අගෝස්තු මාසයේ දිනක සුල්තාන්පූර්හි ලෝදි නගරය අසළ නදියේ ස්නානය කරමින් සිටියදී එක්වරම අතුරුදහන් වූ අතර කිමිදුම්කරුවන් යොදවා ඔහුව සොයාබැලීමට සුල්තාන් දෞලාත් ඛාන් කටයුතු කළ ද ඉන් ඵලක් නොවිණි. එහෙත් දින තුනකට පසු ගං ඉවුරේ නානක් සිටිනු දැකගත හැකිවූ අතර ඔහුගේ කළ පළමු ප්‍රකාශය වූයේ "හින්දු කියා හෝ මුස්ලිම් කියා හෝ පිරිසක් නොමැත" යන්නයි. ඒ අනුව තමා ලත් අවබෝධයත් සමග හින්දු දහම සහ ඉස්ලාම් දහම සමග ඒකාග්‍රතාවක් ඇති කිරීම සඳහා උත්සුක වූ නානක් එතැන් පටන් ප්‍රකට වූයේ ගුරු නානක් දේව් යන නාමයෙනි (http://www.sikhs.org/guru1.htm).

සුල්තාන්වරයාගේ සේවයෙන් ඉවත් වුණු ගුරු නානක්, මර්දානා නම් මිතුරා සමග ආසියාවේ පිහිටි ආගමික ස්ථාන වන්දනා කිරීම සඳහා පිටත් වුණු අතර එම ගමන හැඳින්වෙන්නේ 'උදාසිස්' යන නමිනි. සමස්ත ඉන්දියාව පුරාම සංචාරය කළ ගුරු නානක් පර්සියාව, තුර්කිය, ඉරාකය, මැකා සහ ලංකාවේ අනුරාධපුරයට ද පැමිණි බව කියැවේ. පොදු ජන වන්දනයට පාත්‍ර වූ ආගමික ස්ථාන වන්දනා කිරීමට පමණක් නොව බාහිර ලෝකය පිළිබඳ හොඳ වැටහීමක් ලබාගැනීමට ද මෙම චාරිකාව ගුරු නානක්ට මහෝපකාරී විය (*The New Encyclopaedia Britannica Vol. 27*, 2010:285).

උදාසිස් චාරිකාව නිමාකිරීමෙන් පසු පංජාබයේ කර්තාර්පූර් ප්‍රදේශයට පැමිණි ගුරු නානක් විසින් සීක් දහමේ ව්‍යාප්තිය උදෙසා කටයුතු එහි සිට ආරම්භ කරන ලදී. ගුරු නානක්ගේ ඉගැන්වීම්වල පදනම වූයේ පහත දැක්වෙන කරුණු ය.

- ඇත්තේ එක් දෙවියෙකි (එක් ඔන්කාර්). ඒ දෙවියන් රූපයකින් සිතා ගත නොහැකිය (නිරන්කර්). ඒ දෙවියන් සනාතනික ය (අකල්). ඒ දෙවියන් වරද නොකරයි (අලක්ඛින්). විවිධ ආගම් විසින් ඒ දෙවියන් විවිධ නම්වලින් හැඳින්වුව ද ඇත්තේ එකම දෙවියෙකු පමණි.

- සියලු ආගම් සමාන ය. එසේම දෙවියන් එක ආගමික නිකායකට පමණක් අයත් නොවේ. ඒ දෙවියන් විශ්ව සාධාරණ ජීවය බෙදන්නා ය. සත්‍යයේ (සත්නාම්) නාමයෙන් මුළු ජීවිත කාලය පුරාම කටයුතු කළ යුතු ය.
- දෙවියන් සමග එක්විය හැක්කේ යහපත් ක්‍රියා මගින් පමණි.
- ප්‍රතිමා වන්දනය මෙන්ම වෙනත් ආගම්වල තිබෙන බාහිර පුද පූජා විධි නිරර්ථක ය.
- කාන්තාවන්ට ගෞරව කළ යුතු ය.
- ලෞකික ජීවිතය හැර නොගොස් ගෘහස්ථයෙකු වශයෙන් ගුරුගේ ඉගැන්වීම් අනුව කටයුතු කර දෙවියන් වෙත ළඟා විය හැකිය (පින්තු, 2002:206-208).

ගුරු නානක් දේව් විසින් මෙකී ඉගැන්වීම් ඇතුළත්කොට රචනා කරනු ලැබූ කෘතිද්වය වූයේ 'අසා-දි-වාර්' සහ 'ජප්ජි සහීබ්' ය (පින්තු, 2002:208).

වරක් මෝගල් පාලක බාබුර්ගේ (1526-1530) සිරකරුවෙකු බවට පත්වීමට ගුරු නානක්ට සිදුවුවත් ඉක්මණින්ම ඔහුව නිදහස් කෙරුණේ ඔහු වෙත පැවති සමාජ පිළිගැනීම හේතුවෙනි. මහලු වියට පත් ගුරු නානක් තම පුතුන් දෙදෙනා සහ අනුගාමිකයන් පරීක්ෂාකොට බලා සිය අනුප්‍රාප්තිකයා වශයෙන් තෝරා ගනු ලැබුවේ අංගද් දේව් නම් අනුගාමිකයාව ය. වර්ෂ 1504 මාර්තු 31 වනදා පංජාබයේ සරේනාගාහි හින්දු දෙමාපියන්ට දාව උපන් අංගද් දේව්ගේ සැබෑ නම වූයේ භායි ලේනා ය. මෝගල් පාලක බාබුර්ගේ ආක්‍රමණ හේතුවෙන් පංජාබයේ කදූර්සහීබ් වෙත පැමිණෙන භායි ලේනාට දිනක් ගුරු නානක් පිළිබඳ දැනගැනීමට ලැබිණි. අනතුරුව වන්දනා ගමනක් යන පිරිසක් සමග ගුරු නානක් සොයා කර්තාර්පූර්වලට පැමිණි භායි ලේනා අනතුරුව ජීවිතයේ ඉතිරි කාලය ගුරු නානක් සමීපයේ ගත කිරීමට තීරණය කළේ ය. කල්යත්ම ගුරු නානක්ගේ විශ්වාසය දිනාගත් භායි ලේනා අතිශය පක්ෂපාතී අයෙකු වූ අතර ඒ පිළිබඳ කියැවෙන කතා රැසකි (http://www.sikhs.org/guru2.htm). අවසානයේදී භායි ලේනා තමන්ගේ අනුප්‍රාප්තිකයා වශයෙන් නම් කිරීමට තීරණය කළ ගුරු නානක් විසින් වර්ෂ 1539 සැප්තැම්බර් 7 වනදා භායි ලේනා ස්පර්ශ කොට 'අංගද්' යන නමින් ඔහුව නම්කොට දෙවැනි ගුරු වශයෙන් පත් කරන ලදී. අංගද් යන්නෙහි අර්ථය වන්නේ තමන්ගේ මසින් සෑදුණු අයෙක් නොඑසේ නම් තමන්ගේ කොටසක් යන්නයි (*The New Encyclopaedia Britannica Vol. 27*, 2010:285).

වර්ෂ 1539 සැප්තැම්බර් 22 වනදා ගුරු නානක් දේව් මියයාමත් සමග ගුරු අංගද් දේව් (1539-1552) විසින් තමන්ට ගුරු නානක්ගෙන් හිමි වූ ශුද්ධ ලියවිලි රැගෙන තම උපන් ගම වූ කදූර්සහීබ් වෙත පැමිණ එහි සිට සීක් දහම ව්‍යාප්තිය උදෙසා කටයුතු ආරම්භ කරන ලදී. ඒ යටතේ දේව නාගරී හෙවත් සංස්කෘත අක්ෂර භාවිත කරමින් 'ගුරුමුඛී' නමින් නව අක්ෂර මාලාවක් සීක්වරුන් උදෙසා නිර්මාණය කළ ගුරු අංගද් එය උපයෝගී කොටගෙන ගුරු නානක්ගේ දේශනා ඇතුළත් 'ගුරුභාණි' නම් ග්‍රන්ථය සම්පාදනය කළේ ය. එසේම ගුරු නානක්ගේ චරිතාපදානය සම්පාදනය කිරීමට කටයුතු කළ ගුරු අංගද් විසින් සීක් දහමේ ශුද්ධ වූ ආගමික ග්‍රන්ථය වශයෙන් සැලකෙන ගුරු ග්‍රන්ථ් සහීබ්හි අඩංගු වී තිබෙන ශ්ලෝක 63 ක් රචනා කිරීමට ද කටයුතු කරන ලදී. කුඩා දරුවන්ට ඉගැන්වීමට ඇලුම්කළ ගුරු අංගද්

කුඩා සීක් දරුවන්ගේ අධ්‍යාපනය නඟා සිටුවීමට කටයුතු කළ අතර 'මාල් අඛාරා' නමින් සීක් තරුණයන්ගේ ශාරීරික හා අධ්‍යාත්මික සවිමත් කිරීමේ වැඩසටහන ඇතිකිරීමට ද පුරෝගාමී විය (http://www.sikhs.org/guru2.htm). සීක් දහම වැඩිදුරටත් ජනතාව අතර ව්‍යාප්ත කිරීමේ අරමුණින් 'ගුරු-කා-ලන්ගාර්' හෙවත් එකට හිඳ ආහාර අනුභව කිරීම හඳුන්වා දුන් ගුරු අංගද් ඒ තුළින් ගුරුගේ පටන් සෑම සීක්වරයෙකුම එකට හිඳ ආහාර අනුභව කිරීම සඳහා හුරු කළේ ය. එවකට භාරතයේ තදින්ම පැවති කුල භේදය පිටුදැක සහෝදරාත්මක හැඟීම් වර්ධනයට ඉන් ලැබුණේ මහඟු පිටුවහලකි (පින්තු, 2002:208-209).

රට පුරා සංචාරය කරමින් ගුරු නානක් විසින් ආරම්භ කළ සීක් මධ්‍යස්ථාන වෙත ගිය ගුරු අංගද් තවත් මධ්‍යස්ථාන සියයක් ඇතිකරමින් සීක් දහම සුවිශේෂී අනන්‍යතාවක් සහිත ශක්තිමත් දහමක් බවට පත්කිරීමට අඩිතාලම දැමීමට සමත්විය. එපමණක් නොව සීක්වරුන් සඳහාම වෙන් වූ නව නගරයක් ඉදිකිරීමේ කාර්යය සඳහා ද අවධානය යොමුකළ ගුරු අංගද් ඒ සඳහා තෝරාගෙන තිබුණේ කදූර්සහීබ් ආසන්නයේ ස්ථානයකි. වර්ෂ 1552 මාර්තු 29 වනදා ගුරු අංගද් දේව් මියගිය අතර ඊට පෙර තම ගුරුවරයා අනුගමනය කරමින් ඔහු තම අනුප්‍රාප්තිකයා තෝරාගැනීමට කටයුතු කර තිබිණි. ඒ අනුව ගුරු අංගද් විසින් සීක්වරුන් සඳහාම වෙන්වූ නගරයේ ඉදිකිරීම් වැඩ පරීක්ෂක වශයෙන් සේවය කළ සැත්තෑ දෙවැනි වියේ පසු වූ අමර්දාස් නව ගුරු ලෙස තෝරාගෙන, ඔහුට සීක් දහමේ ශුද්ධ ලියකියවිලි භාරදීමට කටයුතු කරන ලදී. වර්ෂ 1552 මාර්තු 25 වනදා බසාර්කේහි උපන් ගුරු අමර්දාස් (1552-1574) සීක් දහමේ ව්‍යාප්තිය උදෙසා කටයුතු ආරම්භ කළේ ගොයින්ද්වාල් සහීබ් තම මූලස්ථානය කරගනිමිනි (http://www.sikhs.org/guru3.htm).

භාරතයේ තදින්ම මුල් බැසගෙන තිබූ කුල භේදය පිටුදැකීම සඳහා දැඩි කැපවීමකින් ක්‍රියා කළ ගුරු අමර්දාස්, ගුරු අංගද් හඳුන්වා දුන් ගුරු-කා-ලන්ගාර් ක්‍රමය තවත් හොඳින් ක්‍රියාත්මක කිරීමට නියම කළේ ය. ඒ වන විට ඉන්දියාව පුරා පැතිර තිබූ මෝගල් අධිරාජ්‍යයේ අධිරාජයා වූ මහා අක්බාර් (1556-1605) වර්ෂ 1567 දී ගුරු අමර්දාස් හමුවීමට පැමිණ ගුරු-කා-ලන්ගාර් ක්‍රමය පිළිබඳ සතුට පළ කළ අතර ඒ අවස්ථාවේදී ඉස්ලාම් නොවන අයගෙන් අය කෙරුණු ජෙසියා බද්ද ඉවත් කරලීම සඳහා අධිරාජයා පොළඹවා ගැනීමට ගුරු අමර්දාස් සමත්විය. (*The New Encyclopaedia Britannica Vol. 27*, 2010:285). මේ හැරෙන්නට ගුරු අමර්දාස් විසින් සිදුකරනු ලැබූ සේවාවන් අතර සීක්වරුන් සඳහා 'ආනන්ද කරාජ්' නමින් විවාහ ක්‍රමයක් හඳුන්වාදීම, සති පූජාව තහනම් කිරීම සහ කාන්තාවන්ගේ මුහුණ ආවරණය කිරීමේ සිරිත පිටුදැකීම විශේෂයෙන් සඳහන් කළ යුතු ය. සීක් දහමේ ව්‍යාප්තිය උදෙසා ඔහු ගත් ප්‍රායෝගික වැඩපිළිවෙල වූයේ සීක් දහම ප්‍රචාරය කිරීම සඳහා දේශකවරුන් පුහුණු කොට ඔවුන් 'මඤ්ජි' හෙවත් ශාඛා 22 කට බෙදාලීමයි. මේ එක් එක් මඤ්ජි පාලනය කරනු ලැබුවේ ගුරු විසින් පත්කරනු ලැබූ 'නයික්' නම් ආගමික නායකයන් විසිනි (පින්තු, 2002:209).

වර්ෂ 1574 සැප්තැම්බර් 1 වනදා ගුරු අමර්දාස් මියගිය අතර ඊට පෙර ඔහු විසින් තම අනුප්‍රාප්තිකයා ලෙස තෝරාගනු ලැබුවේ ස්වකීය දියණියගේ ස්වාමිපුරුෂයා වූ භායි ජේතා ය. වර්ෂ 1534 සැප්තැම්බර් 24 වනදා ලාහෝරයේදී උපත ලැබූ භායි ජේතා ගුරු

තනතුරට පත්වීමත් සමග හැඳින්වූයේ ගුරු රාම්දාස් (1574-1581) යන නමිනි. ඔහු අතින් සිදු වූ වැදගත්ම කාර්යය වශයෙන් සැලකෙන්නේ ගුරු අංගද් දේව්ගේ සිහිනය වූ සීක්වරුන්ගේ ශුද්ධ නගරය ගොඩනංවා අවසන් කිරීමයි. වර්ෂ 1574 දී නගරයේ ඉදිකිරීම් කටයුතු අවසන් කළ ගුරු රාම්දාස් එහි පදිංචියට පැමිණි අතර එකල 'ගුරු-දා-චක්' නමින් හැඳින්වුණු නගරය පසුව 'චක් රාම්දාස්' නමින් ද, වර්තමානයේදී 'අම්රිත්සාර්' යන නමින් ද ප්‍රකට වී තිබේ. ගුරු රාම්දාස් විසින් නගරය තුළ 'හර්මන්දිර් සහීබ්' (දෙවියන්ගේ මන්දිරය) නමින් මන්දිරයක් ඉදිකරවූ අතර වර්තමානයේදී එය 'දර්බාර් සහීබ්' හෙවත් රන් දෙවොල නමින් ප්‍රකට ය (*The New Encyclopaedia Britannica Vol. 27*, 2010:286) (ඡායාරූපය 1).



**ඡායාරූපය 1 - රන් දෙවොල**

(https://en.wikipedia.org/wiki/Harmandir_Sahib)

ඉන් අනතුරුව නගරයේ 'සරෝවාර්' (සදාකාලික භාවයේ) නම් පොකුණ නිර්මාණය කිරීම සඳහා ද ගුරු රාම්දාස් මුල්විය. එවැනි යෝධ ව්‍යාපෘති සඳහා මුදල් සොයාගැනීමට ඔහු උපකාරී කොටගත්තේ 'මසන්ද්' නම් ක්‍රමයයි. එහිදී ගුරු වෙනුවෙන් අනුගාමිකයන්ගෙන් ආධාර එකතු කිරීම සිදු කෙරුණු අතර ගුරු රාම්දාස් හා අක්බාර් අධිරාජයා අතර පැවති සමීප හිතවත්කම හේතුවෙන් එක් වසරක් පංජාබයෙන් අයබදු එකතු නොකිරීමට අධිරාජයා කටයුතු කර තිබීම ගුරු රාම්දාස්ගේ කටයුතුවලට විශාල පහසුවක් වී තිබුණි (පින්තු, 2002:209). මෙකී කටයුතුවලට අතිරේකව ගුරු රාම්දාස් කළ තවත් කටයුත්තක් වූයේ සීක් විවාහ ක්‍රමය වූ 'ආනන්ද කරාජ්' සඳහා ගීතිකා රචනා කිරීම ය. වර්ෂ 1581 සැප්තැම්බර් 16 වනදා ගුරු රාම්දාස් මියයන්නේ ඔහුගේ යෝධ ව්‍යාපෘතියේ නිමාවක් නොදකිමිනි. මියයාමට පෙර වර්ෂ 1581 අගෝස්තු 31 වනදා ගුරු රාම්දාස් විසින් ස්වකීය අනුප්‍රාප්තිකයා වශයෙන් තම පුත්‍රයා පත්කරනු ලැබූ අතර ඔහු ප්‍රකට වූයේ ගුරු අර්ජන් දේව් (1581-1606) යන නාමයෙනි. ගුරු කෙනෙකුගේ පුත්‍රයෙකු ගුරු තනතුරට පත්වූ පළමු අවස්ථාව මෙය වූ අතර එතැන් පටන් ගුරු තනතුර පාරම්පරික තනතුරක් බවට පත්වූ ආකාරය දැකිය හැකිය (පින්තු, 2002:209).

**සීක් දහම ලෞකිකත්වයට නැඹුරු වීම**

ගුරු අර්ජන් දේව් අතින් සිදු වූ සුවිශේෂීම කාර්යය වූයේ සීක්වරුන්ගේ ශුද්ධ ග්‍රන්ථය වූ 'ආදි ග්‍රන්ථ් සහීබ්' (පසුව ගුරු ග්‍රන්ථ් සහීබ්) ක්‍රමානුකූලව සම්පාදනය කිරීම ය. ගුරු නානක්ගේ පටන් පැවත ආ දේශනා, යාඥා සහ ගීතිකා ඇතුළත් වූ එම ග්‍රන්ථයට ගුරු නානක්ගේ ගීතිකා 976 ක්, ගුරු අංගද්ගේ ගීතිකා 61 ක්, ගුරු අමර්දාස්ගේ ගීතිකා 908 ක්, ගුරු රාම්දාස්ගේ ගීතිකා 679 ක් සහ ගුරු අර්ජන් දේව්ගේ ගීතිකා 2041 ක් මෙන්ම භක්තිවාදයේ ශාන්තුවරුන් වූ කබීර් සහ නාම්දේව් ආදීන්ගේ ගීතිකා ද ඇතුළත් වී තිබිණි. ගුරු අර්ජන් දේව් විසින් වර්ෂ 1604 අගෝස්තු 16 වනදා 'හර්මන්දිර් සහීබ්' හෙවත් රන් දෙවොලෙහි සීක්වරුන්ගේ ශුද්ධ ග්‍රන්ථය වූ 'ශ්‍රී ආදි ග්‍රන්ථ් සහීබ්' උත්සවාකාරයෙන් තැන්පත් කරනු ලැබූ අතර අද දක්වාම එහි ඇති පූජනීයම වස්තුව වශයෙන් සැලකෙන්නේ එකී ග්‍රන්ථයයි (පින්තු, 2002:209-210).

මේ හැරෙන්නට මසන්ද් ක්‍රමය තවදුරටත් වැඩිදියුණු කළ ගුරු අර්ජන් විසින් වාර්ෂිකව සෑම සීක්වරයෙකුම තම ආදායමෙන් දහයෙන් එකක් ගුරු වෙනුවෙන් ගෙවිය යුතු බවට නියම කරන ලදී. එය 'දශ්වන්ඕ' නමින් හැඳින්වේ. සීක්වරුන් සඳහා කර්තාර්පූර් සහ හර්ගෝබින්ද්පූර් නමින් නව නගර දෙකක් නිර්මාණය කිරීමට ද ගුරු අර්ජන් කටයුතු කළේ ය. පංජාබය තුළ මේ අන්දමින් කටයුතු සිදුවන විට ඉන්දියාව තුළ පැවතියේ ගැටුම්කාරී තත්ත්වයකි. මහා අක්බාර් අධිරාජයා මියයාමත් සමග අධිරාජයා වශයෙන් අක්බාර්ගේ පුත්‍ර ජහාන්ගීර් (1605-1627) පත්වුව ද, බොහෝ දෙනාගේ පිළිගැනීම වූයේ අධිරාජයා විය යුත්තේ ජහාන්ගීර්ගේ පුත්‍ර කුෂ්රාව් බවයි. ඒ වන විට කුෂ්රාව් පියාට විරුද්ධ සටනකට සේනා රැස්කිරීම සඳහා පංජාබ් ප්‍රදේශයට පැමිණි හෙයින් ගුරු අර්ජන් දේව්ගේ සහය හිමිකරගැනීමට ඔහුට හැකිව තිබුණි (*The New Encyclopaedia Britannica Vol. 27*, 2010:286).

එහෙත් ලාහෝර් ප්‍රදේශයේ පාලකයා කුෂ්රාව්ට විරුද්ධ වූ හෙයින් ලාහෝරයට පැමිණි ජහාන්ගීර් විසින් කුෂ්රාව් අත්අඩංගුවට ගෙන ඔහුට සහය දුන්නවුන්ට ද දරුණු වධහිංසා පමුණුවා මරණයට පත් කිරීමට නියම කරන ලදී. කුෂ්රාව්ට සහය ලබාදීමේ චෝදනාව මත ගුරු අර්ජන්ට ලක්ෂ දෙකක දඩ මුදලක් නියම කෙරුණ ද, ගුරු අර්ජන් ඊට එකඟ නොවූයෙන් ඔහු සිර අඩස්සියට පත් කෙරිණි (*The New Encyclopaedia Britannica Vol. 27*, 2010:286). අනතුරුව වර්ෂ 1606 මැයි 30 වනදා ජහාන්ගීර්ගේ අණින් ලාහෝරයේදී රත්කළ ලෝහ තැටියක් මත වාඩිකරවීමෙන් ගුරු අර්ජන් මරණයට පත් කරවනු ලැබූ අතර එතෙක් සාමකාමී පිරිසක් වශයෙන් ක්‍රියාකළ සීක්වරුන් යුධකාමී පිරිසක් බවට පත්වීමට ප්‍රධාන හේතුව වූයේ එයයි (පින්තු, 2002:210).

ගුරු අර්ජන්ගේ අනුප්‍රාප්තිකයා වශයෙන් ඔහුගේ පුත්‍ර හර්ගෝබින්ද් (1606-1645) පත්වන අතර ඔහු විසින් තමන් ගුරු තනතුරට පත් වූ උත්සවයේදී වම් පසින් හා දකුණු පසින් කඩු දෙකක් එල්ලා ගෙන එයින් 'පිරි' (ආධ්‍යාත්මික බලය) හා 'මිරි' (ලෞකික බලය) සංකේතවත් කරන බව ප්‍රකාශ කරන ලදී. වර්ෂ 1608 දී හර්මන්දිර් සහීබ් අසළ 'අකාල් තක්ත්' (සර්වබලධාරී සිහසුන) නම් මාළිගාව ඉදිකළ ගුරු හර්ගෝබින්ද් එයින් ගුරුගේ ලෞකික

බලයත්, හර්මන්දිර් සහීබ් තුළින් ගුරුගේ අධ්‍යාත්මික නායකත්වයක් පිළිබිඹු කෙරෙන බව ප්‍රකාශ කළ හෙයින් සීක්වරුන් ඔහුව 'සච පශාහ්' නම් විරුදයෙන් හඳුන්වා තිබේ (*The New Encyclopaedia Britannica Vol. 27*, 2010:286). ක්‍රමයෙන් සීක්වරුන් යුධකාමීන් බවට පත් කළ ගුරු හර්ගෝබින්ද් තම ලාංඡනය සකසා ගත්තේ ඡත්‍රයක්, කල්ගියක් (කිණිස්සක්) සහ මිරි හා පිරි සංකේතවත් කරන කඩු දෙක යොදා ගනිමිනි. අද දක්වාම සීක්වරුන්ගේ සළකුණ වශයෙන් භාවිතා වන්නේ එයයි (පින්තු, 2002:210) (ඡායාරූපය 2).



**ඡායාරූපය 2 - සීක්වරුන්ගේ ලාංඡනය**

(https://en.wikipedia.org/wiki/Sikh)

මේ අතර මෝගල් තර්ජනයෙන් සීක් දහම හා ජනතාව ආරක්ෂා කරගැනීම සඳහා 'ලෝහ්ගාර්හ්' (Fortress of Steel) නමින් බලකොටුවක් අම්රිත්සාර්හි ඉදිකළ ගුරු හර්ගෝබින්ද් සෑම සීක්වරයෙකුටම ආත්මාරක්ෂක සටන් පුහුණුව අනිවාර්ය කළේ ය. අශ්වයන් 700 කගෙන් සමන්විත ඉස්තාලයක් ගුරු හර්ගෝබින්ද් සතු වූ අතර අශ්වාරෝහකයන් 300 ක් සහ තුවක්කුකරුවන් 60 කගෙන් සමන්විත සේනාවක් නිර්මාණය කළ ගුරු හර්ගෝබින්ද් මෝගල් පාලනයට එරෙහිව සටනට පිවිසියේ ය (http://www.sikhs.org/guru6.htm). එහෙත් මෝගල් සේනාවේ බලවත්කම හමුවේ පරාජයට පත් ගුරු හර්ගෝබින්ද් සිරකරුවෙකු ලෙස ගවාලිඔර් සිරගෙදර රඳවා තැබිණි. පසුව ජහාන්ගීර් අධිරාජයා සහ ගුරු හර්ගෝබින්ද් අතර ඇතිවූ සමගියේ ප්‍රතිඵලයක් වශයෙන් නිදහස ලැබූ ගුරු හර්ගෝබින්ද් නැවත පැමිණි අවස්ථාවේදී සීක්වරුන් විසින් හර්මන්දිර් සහීබ් පිහිටි ප්‍රදේශය මල් වෙඩිවලින් හා පහන් ආදියෙන් ආලෝකමත් කරමින් එය සමරන ලදී. එතැන් පටන් අද දක්වාම මේ සිදුවීම සිහිපත් කරමින් 'දිවාලි' නම් උත්සවය සැමරීම සීක් චාරිත්‍රයක් බවට පත්ව තිබේ (*The New Encyclopaedia Britannica Vol. 27*, 2010:286).

නිදහස ලබා පැමිණි ගුරු හර්ගෝබින්ද් විසින් බිහාරයේ සහ බෙංගාලයේ සීක් දහම ව්‍යාප්ත කිරීමට කටයුතු කළ අතර ගීතිකා ගායනා කිරීමේදී ඊට සුමධුර බවක් එක් කිරීම සඳහා 'ටාවුස්' නම් නව සංගීත භාණ්ඩයක් ද නිර්මාණය කරන ලදී. මේ හැරෙන්නට සීක්වරුන් උදෙසා 'කිරාත්පූර්' නමින් නව නගරයක් ඉදිකරවූ ගුරු හර්ගෝබින්ද් තම ජීවිතයේ අවසන් කාලය ගත කළේ එම නගරයේ ය. එයට හේතුව වූයේ නව මෝගල් අධිරාජයා වූ ෂාජහන් (1628-1658) සීක්වරුන් සමග ගැටුම් ඇතිකරගැනීමත් සමග ස්වකීය ආරක්ෂාව උදෙසා අම්රිත්සාර් වෙනුවට කිරාත්පූර් සුදුසු යැයි ගුරු හර්ගෝබින්ද් විශ්වාස කළ හෙයිනි. ගුරු හර්ගෝබින්ද්ට පුත්‍රයන් කිහිප දෙනෙකු සිටිය ද ඔහු තම අනුප්‍රාප්තිකයා වශයෙන් තම පුත්‍ර බාබා ගුරුදිත්තගේ පුත් හර් රායි තෝරාගනු ලැබුවේ ඔහු තුළ දක්නට ලැබුණු ශාන්ත

ගතිපැවතුම් හේතුවෙනි. වර්ෂ 1644 මාර්තු 19 වනදා ගුරු හර්ගෝබින්ද් මියයාමත් සමග ගුරු වශයෙන් කටයුතු ආරම්භ කළ ගුරු හර් රායි (1644-1661) එවකට දහහතරවන වියේ පසු වූ බව කියැවේ. තම මුත්තණුවන් අනුව යමින් 2200 ක අශ්වාරෝහක බලඇණියක් නිර්මාණය කළ ගුරු හර් රායි එය ප්‍රාදේශීය වශයෙන් සීක්වරුන්ට අභියෝගයක් එල්ල කළ කණ්ඩායම් මර්දනයට යොදාගත්තේ ඒ වන විට මෝගල් පාලක ෂාජහන් සමග සංහිඳියාවක් ඇතිකරගෙන තිබූ හෙයිනි (http://www.sikhs.org/guru7.htm). කිරාත්පූර්හි දියුණු ආයුර්වේද රෝහලක් සහ පර්යේෂණ මධ්‍යස්ථානයක් ආරම්භ කළ ගුරු හර් රායි ඒ තුළින් සීක්වරුන්ගේ සෞඛ්‍යය කෙරෙහි අවධානය යොමුකළ අතර වරෙක එහි සේවාව ෂාජහන් අධිරාජයාට පවා හිමිවිණි. අධිරාජයාගේ වැඩිමහල් පුත් දාරා ෂිකෝට වැළඳී තිබූ සුවකළ නොහැකි රෝගයක් සුවපත් කරදීමට ඉහත කී කිරාත්පූර් ආයුර්වේද රෝහලට හැකිවූයෙන් මෝගල්-සීක් සුහදතාව තවදුරටත් වර්ධනය විය (*The New Encyclopaedia Britannica Vol. 27*, 2010:286).

මේ හැරෙන්නට ගුරු අමර්දාස් ආරම්භ කළ මඤ්ජි ක්‍රමය තවත් වර්ධනය කරමින් එය 360 ක් දක්වා වැඩි දියුණු කළ ගුරු හර් රායි අඩාලව පැවති මසන්ද් ක්‍රමය ද නැවතත් ක්‍රමවත් කිරීමට කටයුතු කර තිබේ. ගුරු හර් රායිගේ මුල් කාලය මෙලෙස සාමකාමී අන්දමින් ගතවුණ ද, අවසන් කාලය අර්බුදකාරී එකක් බවට පත්වූයේ මෝගල් සිහසුන වෙනුවෙන් අභ්‍යන්තර අරගල ඇතිව තිබූ හෙයිනි. සීක් ප්‍රතිකාරවලින් දිවි ගලවා ගෙන සිටි ෂාජහන්ගේ වැඩිමහල් පුත් දාරා ෂිකෝගේ රාජ්‍ය උරුමය වෙනුවෙන් ගුරු හර් රායි සහය පළ කර තිබූ අතර ඊට බලපෑ තවත් හේතුවක් වී තිබුණේ දාරා ෂිකෝ ආගමික සහනශීලීත්වයක් විශ්වාස කළ අයෙකු වීමයි (පින්තු, 2002:210).

එහෙත් රාජප්‍රාප්ති සටනින් ජයගත් ෂාජහන්ගේ තවත් පුත්‍රයෙකු වූ ඖරංසෙබ් (1658-1707) දාරා ෂිකෝ හා ඔහුගේ පුත්‍රයා මරාදැමීමට කටයුතු කළේ අවමන් කරමින් දිල්ලිය පුරා ඔවුන්ව සංචාරය කරවීමෙන් පසුව ය. අනතුරුව දාරා ෂිකෝ වෙනුවෙන් සහය පළ කළ ගුරු හර් රායිට දිල්ලියට පැමිණෙන ලෙස ඖරංසෙබ් නියම කළ නමුත් ඒ වෙනුවට එවනු ලැබුවේ ගුරුගේ පුත් බාබා රාම් රායි ය. ඉන් ගුරු හර් රායිගේ අපේක්ෂා කළේ බාබා රාම් ලවා ඖරංසෙබ්ට ආදි ග්‍රන්ථ් සහීබ් පිළිබඳ වැටහීමක් ලබාදී සීක් දහම උදෙසා සහනයක් ලබාගැනීමට උත්සහ කිරීමයි. එහෙත් බාබා රාම් රායි විසින් දිල්ලියේදී ආදි ග්‍රන්ථ් සහීබ්හි ඇතැම් කොටස් මුස්ලිම්වරුන්ට පක්ෂපාතී අන්දමින් වෙනස් කරනු ලැබීමත් සමග ඒ සියල්ල ප්‍රතික්ෂේප කරනු ලැබූ ගුරු හර් රායි විසින් ගුරු ග්‍රන්ථ් සහීබ්හි ඇතුළත් මුල් කරුණු කිසිවිටෙකත් විකෘති නොකළ යුතු බවට නියමයක් පනවන ලදී (*The New Encyclopaedia Britannica Vol. 27*, 2010:287).

කෙසේ වෙතත් බාබා රාම් රායිගේ කාර්යය පිළිබඳ පැහැදුණු ඖරංසෙබ් මීළඟ ගුරු ලෙස බාබා රාම් රායි පත්කරන මෙන් ගුරු හර් රායිගෙන් ඉල්ලා සිටිය ද, ගුරු හර් රායි එය ප්‍රතික්ෂේප කළේ බාබා රාම් රායි සීක්වරුන්ට එරෙහිව කළ ක්‍රියාව හේතුවෙන් ඔහු ගුරු තනතුරට නුසුදුසු බව දක්වමිනි. එපමණක් නොව දිවි හිමියෙන් සීක් දහම වෙනුවෙන් කැපවන අයෙකුට පමණක් ගුරු තනතුර සුදුසු බව ප්‍රකාශ කළ ගුරු හර් රායි නැවත කිසි

දිනක තමා මුණගැසීමට නොඑන ලෙස තම පුත් බාබා රාම් රායිට තරයේ අවවාද කළේ ය. වර්ෂ 1661 ඔක්තෝබර් 6 වනදා ගුරු හර් රායි මියගිය අතර ඊට පෙර ඔහු විසින් මීළඟ ගුරු වශයෙන් තමන්ගේ පස් හැවිරිදි පුත්‍ර හර් කිෂන් (1661-1664) නම් කරන ලදී. එහෙත් ඖරංසෙබ්ගේ සහය හිමිකරගත් බාබා රාම් රායි එකී පත්කිරීම ප්‍රතික්ෂේප කරමින් තම අනුගාමිකයන් සමග 'රාම්රායියා' නමින් නව පාර්ශවයක් ඇතිකරගත්තේ ඩෙහ්රා ඩූන් ප්‍රදේශය මූලස්ථානය කොටගෙන ය. ඒ නිසා රාම්රායියා පාර්ශවයේ පිළිගැනීම වනුයේ ගුරු හර් රායිගෙන් පසුව ගුරු ධූරයට පත්වූයේ ගුරු බාබා රාම් රායි බවයි (*The New Encyclopaedia Britannica Vol. 27*, 2010:287).

ගුරු හර් රායිගේ සැබෑ අනුප්‍රාප්තිකයා වූ ගුරු හර් ක්‍රිෂන් ලාබාල වියේදී ගුරු වූ හෙයින් සීක්වරුන් විසින් ඔහුව හඳුන්නු ලැබුවේ 'බාල් ගුරු' (ළමා ගුරු) යන නමිනි. එහෙත් ගුරු හර් ක්‍රිෂන් සතු වූ බුද්ධිමත් භාවය හා ඔහු අභියෝගවලට මුහුණ දුන් ආකාරයෙන් විශාල පරිණත බවක් පෙන්නුම් කළ බව කියැවේ. ගුරු හර් ක්‍රිෂන් විනාශ කරදැමීමේ අරමුණින් තම හිතවතා වූ ඖරංසෙබ් අධිරාජයා ලවා දිල්ලියට පැමිණෙන ලෙස ගුරු හර් ක්‍රිෂන්ට නියම කිරීමට බාබා රාම් රායි සමත්ව තිබුණි. ගුරු හර් රායි මියයෑමට පෙර කිසිදිනෙක ඖරංසෙබ් මුණ නොගැසිය යුතු යැයි ගුරු හර් ක්‍රිෂන්ට නියම කර ඇති හෙයින් එය ඔහු ලවා කඩ කරවීමෙන් සීක්වරුන් අතර ගුරු හර් ක්‍රිෂන් අප්‍රසාදයට පත් කරවීම බාබා රාම් රායිගේ අපේක්ෂාව විය. අනෙක් අතට ගුරු හර් ක්‍රිෂන් දිල්ලියට නොපැමිණියහොත් අධිරාජයාගේ අණට පිටුපෑ බවට චෝදනා එල්ලකොට අත්අඩංගුවට ගැනීමට සැලසුම් කර තිබුණ ද, එය ව්‍යර්ථ වූයේ ගුරු හර් ක්‍රිෂන් දිල්ලියට ඒමට එකඟ වූ හෙයිනි. ඖරංසෙබ්ගේ අණින් ගුරු හර් ක්‍රිෂන් දිල්ලියට කැඳවා ගෙන ඒමට පිටත් වූ මිර්සාහි රාජා වූ ජායි සිං සීක්වරුන්ගේ හිතවතෙකු වූ හෙයින් ඔහු විසින් ගුරු හර් ක්‍රිෂන් සුරක්ෂිතව දිල්ලියට රැගෙන විත් ඖරංසෙබ්ට හමුවීමට නොදී ආරක්ෂාව සපයන ලදී (http://www.sikhs.org/guru8.htm).

දිල්ලියේ සිටි සීක්වරුන් උදෙසා ජායි සිංගේ ඇරයුමින් දේශනයක් පැවැත්වූ ගුරු හර් ක්‍රිෂන් හමුවට පැමිණි ලාල් චන්ද් නම් බ්‍රාහ්මණයා විසින් ලාබාල වියේ පසු වූ ගුරුගේ දැනුම පරීක්ෂා කිරීමට අභියෝග කළ අතර එහිදී භගවද් ගීතාව අර්ථ ගන්වමින් ගුරු හර් ක්‍රිෂන් කළ දේශනාව පිළිබඳ සියල්ලෝම මවිතයට පත්වූහ. මේ කාලයේදී දිල්ලිය පුරා වසූරිය පැතිර තිබූ හෙයින් වසූරිය රෝගීන්ට ආශිර්වාද කරමින් ඔවුන් සුවකිරීමට ගුරු හර් ක්‍රිෂන් කටයුතු කළ අතර අවසානයේදී ගුරු හර් ක්‍රිෂන්ට ද වසූරිය වැළඳිණි. ජායි සිංග්ගේ මාළිගාවක වාසය කළ ගුරු හර් ක්‍රිෂන් වර්ෂ 1664 මාර්තු 30 වනදා මියගිය අතර ඔහුව යමුනා ගං ඉවුරේ ආදාහනය කළ ස්ථානයේ ගුරු වෙනුවෙන් ස්මාරකයක් ඉදිකෙරුණේ 'ගුරුද්වාර බාල සහීබ්' යන නමිනි. ඒ දෙස බලා සිටීමෙන් පවා රෝග සුවවන බව සීක්වරුන්ගේ පිළිගැනීමයි. ගුරු හර් ක්‍රිෂන් නැවතී සිටි ජායි සිංගේ මාළිගාව 'ගුරු ද්වාර බංග්ලා සහීබ්' නමින් පූජනීය ස්ථානයක් බවට පත්කෙරුණු අතර ඔහු විසින් දිල්ලිවාසීන්ට කළ සේවාව වෙනුවෙන් හින්දූන් විසින් 'බාල්මුකන්ද්' නමින් ද, මුස්ලිම්වරුන් විසින් 'බාලා පිර්' නමින් ද ගුරු හර් ක්‍රිෂන් සිහිපත් කරනු ලැබේ (http://www.sikhs.org/guru8.htm).

ගුරු හර් ක්‍රිෂන් මියයාමට පෙර අහස දෙසට දෑත් දිගුකොට "බාබා බකාලා" යනුවෙන් ප්‍රකාශ කළ අතර ඉන් අදහස් කෙරුණේ මීළඟ ගුරු සිටින්නේ බාබා බකාලා ප්‍රදේශයේ බව තීරණය කළ සීක්වරුන් විසින් මීළඟ ගුරු වශයෙන් තෝරාගනු ලැබුවේ එහි වාසය කළ ගුරු හර් ගෝබින්ද්ගේ පුත්‍රයෙකු වූ තේස් බහාදූර් (1664-1675) ය. වර්ෂ 1664 අප්‍රේල් 16 වනදා ගුරු වශයෙන් පත් කෙරුණු ඔහුගේ සැබෑ නාමය වූයේ 'ත්‍යාග් මල්' යන්නයි. මෝගල්වරුන්ට එරෙහිව ගුරු හර් ගෝබින්ද් විසින් සිදුකළ සටන්වලදී ත්‍යාග් මල් දැක්වූ දක්ෂතාවලට ගරු කිරීමක් වශයෙන් 'තේස් බහාදූර්' හෙවත් 'ශක්තිමත් අසිපත' යන විරුද නාමය පියා විසින් ලබාදී තිබිණි. එසේම දුනුවායන් සහ අශ්වාරෝහකයන් පුහුණු කිරීම පිළිබඳව ද තේස් බහාදූර් දක්ෂතාවක් ඉසිලී ය (*The New Encyclopaedia Britannica Vol. 27*, 2010:287).

ගුරු තේස් බහදූර් ඉන්දියාවේ පුරා විවිධ ප්‍රදේශවල සීක් දහම ව්‍යාප්ත කිරීම අරමුණු කරගනිමින් ඇසෑම්, ඩකා වැනි ප්‍රදේශවල සංචාරය කළ අතර ඒ අතරවාරයේ වර්ෂ 1666 දෙසැම්බර් 31 වනදා ඔහුගේ පුත්‍ර ගෝබින්ද් රායි උපත ලැබීය. මේ සංචාරය අතරතුරදී ඇසෑමයේ ධුබ්‍රි නගරයේ ගුරු ද්වාරයක් පිහිටුවීමට ගුරු තේස් බහදූර් කටයුතු කළ අතර ඒ ස්ථානයට මුල්ම සීක් ගුරු වූ ගුරු නානක් දේව් පවා පැමිණි බව කියැවේ. පසුව එම ස්ථානය 'ගුරු ද්වාර ශ්‍රී ගුරු තේස් බහදූර් සහිබ්' නමින් නම් කෙරුණු අතර අද දක්වාම එය සීක්වරුන්ගේ වන්දනීය ස්ථානයකි (http://www.sikhs.org/guru9.htm).

සීක්වරුන් උදෙසා මඛෝවාල් ප්‍රදේශයේ නව නගරයක් නිර්මාණය කිරීමේ කාර්යය ගුරු තේස් බහදූර් ආරම්භ කළ අතර ආනන්ද්පූර් නම් වූ මේ නගරය ඉදිකිරීමත් සමග සීක්වරුන් විසින් ගුරු තේස් බහදූර් සඳහා 'සචා බාද්ෂාහ්' (සැබෑ රජු) නම් විරුදය භාවිතකොට තිබේ (*Encyclopaedia Asiatica Vol. VIII*, 1982:622).

මේ කාලය වනවිට මෝගල් අධිරාජයා වූ ඖරංසෙබ් විසින් සමස්ත ඉන්දියාව මුස්ලිම් අධිරාජ්‍යයක් බවට පත්කිරීමට කටයුතු කරමින් සිටි අතර හින්දු දේවාල විනාශ කිරීම, හින්දු රජයේ සේවකයන් සේවයෙන් පහ කිරීම සහ අන්‍යාගමිකයන් විසින් ගෙවිය යුතු ජෙසියා බද්ද වැඩි කිරීම ආදී කටයුතුවලට පියවර ගෙන තිබිණි. කාශ්මීරයේ විසූ බමුණු පඬිවරුන් ඉස්ලාම් බවට පත්කරගතහොත් පහසුවෙන් ඉන්දියානුවන් ඉස්ලාම් දහමට හරවා ගත හැකි බව ඖරංසෙබ් විශ්වාස කළ හෙයින් කාශ්මීර හින්දුවරුන් පත්වූයේ බරපතල අපහසුතාවකට ය. කාශ්මීර හින්දුවරුන් මේ තර්ජනයෙන් මිදීම සඳහා ගුරු තේස් බහදූර්ගේ සහය පැතූ අතර ඔවුන් මුහුණදුන් ගැටළුවට සීක්වරුන් ද මුහුණ දී සිටි හෙයින් බලහත්කාරයෙන් ඉන්දියානුවන් ඉස්ලාම් දහමට හරවා ගැනීම වළක්වන්නැයි ඖරංසෙබ්ගෙන් ඉල්ලා සිටීමට ගුරු කටයුතු කළේ ය. තමන්ව ඉස්ලාම් දහමට හරවා ගත හැකි නම් සියලු දෙනාම කැමැත්තෙන් ඉස්ලාම් දහම වැළඳගන්නා බවට අභියෝගයක් අධිරාජයාට එල්ල කිරීමට ගුරු තේස් බහාදූර් කටයුතු කළ හෙයින් ඔහු ගත් ක්‍රියාමාර්ගය සියල්ලන්ගේම පැසසුමට ලක්විණි (*The New Encyclopaedia Britannica Vol. 27*, 2010:287).

ඒ නිසා ඖරංසෙබ්ගේ අණින් ගුරු තේස් බහාදූර් අත්අඩංගුවට ගැනීම සඳහා මෝගල් සෙබළු පැමිණි අතර අධිරාජයාගෙන් තම දිවියට හානියක් විය හැකියැයි අනුමාන කළ ගුරු

තේග් බහාදූර් විසින් ස්වකීය පියා වූ ගුරු හර්ගෝබින්ද්ගෙන් හිමිව තිබූ අසිපත තම පුත්‍ර ගෝබින්ද් රායිට පළඳවා දිල්ලියේදී තමන් මරා දැමුවහොත් නව ගුරුවරයා විය යුත්තේ තම පුත්‍රයා බව ප්‍රකාශයට පත් කරන ලදී. මෝගල් අත්අඩංගුවට පත් ගුරු තේග් බහදූර් හා ඔහුගේ සමීපතමයන් තිදෙනෙකු සිර මැදිරියක දමාගෙන රූප්නගර්, සර්හින්ද් හා බස්සි පතානා යන නගරවලට රැගෙන ගොස් තෙමසකට පසු එනම් වර්ෂ 1675 නොවැම්බර් මාසයේදී රැගෙන ආවේ දිල්ලියට ය. දම්වැලකින් බැඳ දමා තිබූ ගුරු තේග් බහදූර්ට විවිධ වධහිංසා සිදුකරමින් ඉස්ලාම් දහමට හරවා ගැනීමට උත්සහ කළ ද, එය සාර්ථක නොවූයෙන් ඖරංසෙබ්ගේ අණින් වර්ෂ 1675 නොවැම්බර් 24 වනදා ඔහුව චාන්දනී චෝක්හිදී හිසගසා මරා දැමුණි. හින්දූන්ගේ ආගමික අයිතිය වෙනුවෙන් දිවි පිදූ ගුරු තේග් බහාදූර්ට හින්දූන්ගේ ගෞරව පිරිනැමුණේ 'හින්දි-දි-චදාර්' (ඉන්දියාවේ පළිහ) නමින් ඔහුව නම් කිරීමෙනි (http://www.sikhs.org/guru9.htm).

මරාදැමුණු ගුරු තේග් බහාදූර්ගේ දේහය දිල්ලියේදී ප්‍රදර්ශනය කළ අවස්ථාවේදී ගුරුගේ ශිෂ්‍යයෙකු වූ ලාකි ෂාහ් වන්ජරා විසින් දේහය සොරකම් කොට රහසේම ආදාහනය කරනු ලැබුවේ ගුරු තේග් බහාදූර්ට තවදුරටත් අපහාස සිදුවීම වැළැක්වීමට ය. පසුකලෙක එකී ආදාහන ස්ථානයේ ඉදිකෙරුණු ස්මාරකය හැඳින්වූයේ 'ගුරු ද්වාර රකාබ් ගන්ජ් සහීබ්' යන නමිනි. එපමණක් නොව ගුරු තේග් බහාදූර්ගේ හිස ගසා දැමූ චන්ද්නී චෝක්හි පසුකලෙක 'ගුරු ද්වාර සිස් ගන්ජ් සහීබ්' නමින් ස්මාරකයක් ද ඉදිකෙරිණි. හිස ගසා දැමුණු ගුරු තේග් බහාදූර්ගේ හිස ආනන්ද්පූර් වෙත රැගෙන එනු ලැබීමෙන් පසුව ආදාහනය කළ ස්ථානයේ ඉදිකෙරුණු ස්මාරකය ද නම් කෙරුණේ 'ගුරු ද්වාර සිස් ගන්ජ් සහීබ්' නමිනි (http://www.sikhs.org/guru9.htm).

**අවසන් සීක් ගුරුවරයා**

තම පියා වීරයෙකු ලෙස මරණයට මුහුණ දීමත් සමග වර්ෂ 1675 නොවැම්බර් 24 වනදා ගුරු තනතුරට පත් වූ නව හැවිරිදි ගුරු ගෝබින්ද් රායි (1675-1708) සීක් දහමේ විප්ලවීය වෙනසක් සිදුකළ ගුරුවරයා විය. එහිදී අද දක්වා පැවත එන සීක්වරුන්ගේ ප්‍රධාන චාරිත්‍ර කිහිපයක් හඳුන්වාදෙනු ලැබුවේ ඔහු විසිනි. කුඩා කළ පටන් යුධ ශිල්පය මනාව හදාළ ගුරු ගෝබින්ද් ගුරුමුඛී, හින්දි, සංස්කෘත හා පර්සියන් භාෂා පිළිබඳ ප්‍රවීණත්වය ලබා තිබුණි (පින්තු, 2002:212). මුල්කාලීනව ගුරු ගෝබින්ද් විසින් මෙහෙය වූ සටන් කීපයකින්ම මුස්ලිම් නායකයක් පරාජය ලද හෙයින් ගුරුට එරෙහිව ඖරංසෙබ් සේනා පිටත් කළේ අනාගතයේදී ඔහු තර්ජනයක් විය හැකි හෙයිනි. එහෙත් උපායශීලී වෙමින් සටනට පිවිසි ගුරු ගෝබින්ද්ට පහසුවෙන්ම මෝගල් සේනාව පරාජයට පත් කිරීමට හැකිවිණි (http://www.sikhiwiki.org/index.php/Guru_Gobind_Singh).

මෝගල් තර්ජනයට සාර්ථකව මුහුණදීමටත්, සීක්වරුන් නිශ්චිත ප්‍රතිපදාවකට අනුව සකස් කිරීමත් අරමුණු කරගත් ගුරු ගෝබින්ද් විසින් වර්ෂ 1699 දී තමන්ගේ අනුගාමිකයන් සඳහා 'හුක්මානමස්' හෙවත් අධිකාරී හසුනක් පිටත් කොට සියලු සීක්වරුන්ට වර්ෂ 1699 අප්‍රේල් 14 වනදා ආනන්ද්පූර්හි පැවැත්වෙන සමුළුවට සහභාගිවීමට නියම කරන ලදී.

ආනන්ද්පූර්හි පිහිටි කුඩා කඳුගැටයක් (මෙම කඳුගැටය දැන් හඳුන්වන්නේ 'කෙස්ගාර්හ් සහීබ්' යන නමිනි) මත ඉදිකළ කුඩාරමක සිට පිරිස ඇමතූ ගුරු ගෝබින්ද් තමා වෙනුවෙන් දිවි පිදීමට කැමති පුද්ගලයන්ට ඉදිරියට පැමිණෙන්නැයි ඉල්ලා සිටියේ ය. තෙවරක්ම එය ප්‍රකාශ කිරීමේදී දයා රාම් නම් අනුගාමිකයා ඉදිරියට පැමිණියෙන් ඔහුව තමන් සිටි කුඩාරමට කැඳවාගෙන ගිය ගුරු ගෝබින්ද් මඳ වේලාවකින් ලේ තැවරුණු කඩුවක් අතැතිව පැමිණ නැවතත් ගුරු වෙනුවෙන් දිවි පිදීමට කැමති පුද්ගලයන් ඉදිරියට කැඳවූ අතර පෙර පරිදිම ඉදිරිපත් වූයේ එක් අයෙකු පමණි. ඒ අන්දමට පිළිවෙලින් ගුරු වෙනුවෙන් දිවි පිදීම සඳහා පැමිණි පස්දෙනා කුඩාරමට රැගෙන ගිය ගුරු ගෝබින්ද් අවසානයේදී කිසිදු හානියක් නොවී සිටි එකී අනුගාමිකයෝ පස් දෙනා සමග පිටතට පැමිණියේ නව වස්ත්‍රවලින් සැරසී ගෙන ය (*The New Encyclopaedia Britannica Vol. 27,* 2010:287).

අනතුරුව ජලය දැමූ යකඩ බඳුනකට 'පටශස්' හෙවත් පංජාබයේ ඇති රස ගන්වන දේ එක්කොට ආදි ග්‍රන්ථ්හි ගීතිකා ගයමින් තම කඩුවෙන් කැලතූ ගුරු ගෝබින්ද් මෙම රස ගැන්වූ ජලය හා යකඩ මිශ්‍ර වූ දියරය 'අම්රිත්' හෙවත් අමෘතය වශයෙන් නම්කොට තම කඩුවෙන් එය ගෝලයන්ට ඉසිමින් ඔවුන්ව පාරිශුද්ධ තත්ත්වයට පත් කළේ ය. එතැන් පටන් 'පාන්ච් පියාරා' (ආදරණීය පස් දෙනා) යන නාමයෙන් ඔවුන්ව හැඳින්විය යුතු බවට නියම කළ ගුරු ගෝබින්ද් විසින් ඔවුන් 'ඛල්සා' හෙවත් පාරිශුද්ධ පුද්ගලයන් වශයෙන් නම් කරන ලදී. එසේම එතැන් පටන් ඛල්සාවට ඇතුළත් වන පුරුෂයන්ගේ නම අවසානයට 'සිං' හෙවත් සිංහයා යන යෙදුමත්, කාන්තාවන්ගේ නම අවසානයට 'කවූර්' හෙවත් කුමාරි යන යෙදුමත් භාවිත කිරීමට ගුරු නියම කළේ ය (*The New Encyclopaedia Britannica Vol. 27*, 2010:287).



**ඡායාරූපය 3 - ඛල්සා චාරිත්‍රය**

(https://sites.google.com/site/akalpurakh/mayarchive)

ඉන් අනතුරුව තමා ද ඛල්සාවට ඇතුළත් විය යුතු හෙයින් පාන්ච් පියාරා ලෙස නම් කෙරුණු බායි දයා සිං, බායි ධරම් සිං, බායි හිම්මත් සිං, බායි මොහ්කම් සිං සහ බායි සහීබ් සිං ඉදිරියේ දණ ගැසූ ගුරු ගෝබින්ද් තමාව ඛල්සාවට ඇතුළත් කරගන්නා මෙන් ඉල්ලා සිටියේ ය. ඒ අනුව අම්රිත්වලින් පාරිශුද්ධ කිරීමෙන් පසු ඛල්සාවට ඇතුළත් කර ගැනුණු ඔහුව එතැන් සිට හඳුන්වන ලද්දේ ගුරු ගෝබින්ද් සිං යනුවෙනි. එසේම ඛල්සා

සහෝදරත්වයේ පියා වශයෙන් සැලකෙන්නේ ද ගුරු ගෝබින්ද් සිං ය (*The New Encyclopaedia Britannica Vol. 27*, 2010:287).

මීළඟට සභාව ඇමතූ ගුරු ගෝබින්ද් එතැන් පටන් ජාති, කුල භේද නොතිබිය යුතු බවත්, හින්දු හෝ මුස්ලිම් යනුවෙන් භේදයක් නොමැති බවත්, එකම සර්වබලධාරී දෙවියන් කෙරෙහි විශ්වාසය තැබිය යුතු බවත්, සියලුදෙනා සහෝදරත්වයෙන් ජීවත් විය යුතු බවටත් නියම කළ අතර 'ක පහක්' නම්කොට එය සැමවිටම පැළඳීමට හා පවත්වා ගැනීමට උපදෙස් ලබා දී තිබේ (*The New Encyclopaedia Britannica Vol. 27*, 2010:287A).

"ක පහ" වන්නේ,

- කේශ්-නොකපන ලද හිස කෙස්
- කංග-ලී පනාව
- කර-ලෝහ වළල්ල
- කචෙරා-දිග යට ඇඳුම
- ක්‍රිපන්-තියුණු වකුටු වූ කඩුව (විජේතුංග,2006:237).

එසේම 'කුරෙහ්ට්' (නොකළ යුතු දේවල්) සතරක් හඳුන්වා දෙමින් එයට හිසකෙස් කැපීම, තහනම් කළ මාංශ අනුභව කිරීම, දුම්කොළ හා මත්ද්‍රව්‍ය භාවිතා කිරීම, පරදාර සේවනය කිරීම ඇතුළත් කළ ගුරු ගෝබින්ද් නොකපන ලද හිසකෙස් 'දාස්තාර්' නම් ජටාවෙන් ආවරණය කරගත යුතු බවත්, කිසි දිනක ප්‍රතිමා වන්දනාව නොකළ යුතු බවත්, තම භක්තිය හා ආත්ම ගෞරවය උදෙසා ඕනෑම විටෙක සටන් කිරීමට සූදානම් විය යුතු බවටත් උපදෙස් ලබා දුන්නේ ය. සීක්වරුන්ගේ අනාගතය වෙනුවෙන් පදනම දැමූ මෙම සමුළුව හැඳින්වෙන්නේ 'වයිසාඛි අම්රිත් සංස්කාර්' යන නමිනි (*The New Encyclopaedia Britannica Vol. 27*, 2010:287A).

මෙලෙස ගුරු ගෝබින්ද් සිං යටතේ සීක්වරුන් ශක්තිමත් නැගී ඒම පිළිබඳ හිමාල කඳුවැටියේ සිවාලික්හි මහාරාජාවරුන් අප්‍රසාදය පළ කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන් සමග සිදු වූ සටන් කිහිපයකින්ම ජයහිමිවූයේ ගුරු ගෝබින්ද්ට ය. මෙනිසා මෝගල් ආධාර ලබාගත් මහාරාජාවරුන් එමගින් සීක්වරුන් පැරදවීමට සැලසුම් කළ ද, වර්ෂ 1701 දී සිදු වූ පළමුවන ආනන්ද්පූර් සටනින් මෙම ඒකාබද්ධ හමුදාව පැරදවීමට ගුරු ගෝබින්ද් ඇතුළු සීක් හමුදාවට හැකිවිණි (*Collier's Encyclopedia Vol. 21*, 1984:22).

නැවත වරක් ඒකාබද්ධ පෙරමුණක් ඇතිකරගත් මහාරාජාවරුන්ව දෙවන ආනන්ද්පූර් සටනින් පැරදවීමට ගුරු ගෝබින්ද්ට හැකිවූ හෙයින් මහාරාජාවරුන්ට සිදුවූයේ සාම ගිවිසුමකට එළඹීමට ය. ඒ යටතේ ආනන්ද්පූර් ප්‍රදේශය මහාරාජාවරුන්ට ලබාදී නිර්මොහ් බලා පිටත් වීමට ගුරු ගෝබින්ද් එකඟ වූ නමුත් සාම ගිවිසුම කඩකරමින් කඳුකර මහාරාජාවරුන් කිහිප දෙනෙකු අවස්ථා දෙකකදී ගුරු ගෝබින්ද්ට පහර දුන්න ද, ඉන් ආරක්ෂා වීමට ගුරු ඇතුළු පිරිසට හැකිවුණි. කෙසේ නමුත් මේ තත්ත්වය තුළ නැවතත් ආනන්ද්පූර් වෙත පැමිණි ගුරු ගෝබින්ද් වර්ෂ 1703-1704 කාලයේ පැවති තෙවැනි

ආනන්ද්පූර් සටනින් ද ජයගැනීමට සමත්විය (http://www.sikhiwiki.org/index.php/Guru _Gobind_Singh).

එහෙත් මේ කිසිවකින් පසුබට නොවූ කඳුකර මහාරාජාවරුන් නැවතත් ආනන්ද්පූර් වෙත පහරදුන්නේ මෝගල් ආධාර ලබාගනිමිනි. එය සීක්වරුන් අස්වනු නෙළන කාලය වූ හෙයින් සාර්ථකව ප්‍රතිප්‍රහාර එල්ලකිරීමට නොහැකි වීමත් සමග ආනන්ද්පූර් අතහැර පලායාමට ගුරු ගෝබින්ද් විසින් තීරණය කරන ලදී. එහෙත් නගරය කොල්ලා කා ආපසු යන සතුරු හමුදාව සතු වස්තුව නැවතත් අත්පත් කරගැනීමට ගුරු ගෝබින්ද් සමත්වූයේ විශ්මයජනක පහරදීමක් සිදුකරමිනි. නැවත ආනන්ද්පූර් වෙත ගිය ගුරු ගෝබින්ද් ඇතුළු පිරිසට ප්‍රහාර එල්ලකොට නගරය වටලා ගැනීමට මහාරාජාවරුන් සමත් වූ හෙයින් සීක්වරුන්ට ආනන්ද්පූර් අතහැර පලායාමට අවස්ථාවක් ලබාදී තිබුණි. එහිදී ගුරු ගෝබින්ද් විසින් පළමුව පිටත් කරන ලද හිස් ගැල් කිහිපයට සතුරන් පහරදීමත් සමග ගුරුගේ තීරණය වූයේ ආනන්ද්පූර් අතහැර යෑම ප්‍රතික්ෂේප කිරීමට ය (http://www.sikhiwiki.org/index.php/ Guru_Gobind_Singh).

පසුව ආනන්ද්පූර් අතහැර යන පිරිසට කිසිදු හිරිහැරයක් නොවන බවට ඖරංසෙබ් අධිරාජයා කුරාණයේ නාමයෙන් පොරොන්දු වීමත් සමග ආනන්ද්පූර් අතහැරීමට සියලු කටයුතු සූදානම් කෙරිණි. කෙසේ වෙතත් ආනන්ද්පූර් අතහැර යන සීක්වරුන්ට නැවතත් සතුරු හමුදාවේ ප්‍රහාරයක් එල්ලවිය. ඉන් සීක් පිරිස විසිරී යාමත් සමග අතරමංව සිටි ගුරුගේ මව හා බාල පුතුන් දෙදෙනා වූ ෆටේ සිං හා සොරාවර් සිං අල්ලාගැනීමට සිර්හින්දිහි පාලක වසීර් ඛාන්ට හැකිවිය. ගුරුගේ පුතුන්ට ඉස්ලාම් භක්තිකයන් කිරීමට වසීර් ඛාන් උත්සහ කළ ද, ඔවුන් එය ප්‍රතික්ෂේප කළ හෙයින් ඔවුන්ව පණ පිටින් බිත්තියකට තබා බැඳීමට නියම කෙරිණි. ඉන් ජීවිතක්ෂයට පත් ගුරු ගෝබින්ද්ගේ බාල පුතුන් දෙදෙනා සිහිවීමට පසුව එම ස්ථානයේ ඉදිකළ ස්මාරකය හඳුන්වනු ලබන්නේ 'ෆටේසර්හ් සහීබ් ගුරු ද්වාර' යන නමිනි (http://www.sikhiwiki.org/index.php/ Guru_Gobind_Singh).

වර්ෂ 1705 දී චම්කවූර් සටන සඳහා ගුරු ගෝබින්ද් සමග සහභාගි වූ ගුරුගේ වැඩිමහල් පුතුන් දෙදෙනා වූ අජිත් සිං සහ ජුජාර් සිං ඝාතනය කිරීමට සතුරු පිරිස් සමත් වූහ. සටන අසාර්ථක වීමේ ලකුණු පහළ වීමත් සමග ගුරු ගෝබින්ද් රැඳී සිටි චම්කවූර් බලකොටුවෙන් ඔහුව ඉවත් කිරීමට අනුගාමිකයන් තීරණය කළේ ඛල්සාවේ පැවැත්ම උදෙසා ගුරු ජීවත්වීම අනිවාර්ය වූ හෙයිනි. එහිදී සතුරන් මුළාකිරීම සඳහා ගුරුගේ සන්නාහය හා ජටාවේ පළඳින ආභරණය පැළඳගත් බාබා සංගත් සිං ගුරු ගෝබින්ද් ලෙස පෙනී සිටින අතරවාරයේ ගුරු ගෝබින්ද් මච්චිවාරා ප්‍රදේශයට පලායාමට සමත්විය. පසුදින බලකොටුව ආක්‍රමණය කළ මෝගල් සෙබළු බලකොටුවේ රැඳී සිටි සීක්වරුන් සියලුදෙනාවම ඝාතනය කර දැමීමට කටයුතු කළහ (http://www.sikhiwiki.org/index.php/ Guru_Gobind_Singh).

මච්චිවාරා සිට උතුරේ ප්‍රදේශ බලා ගමන් කළ ගුරු ගෝබින්ද්ට හසුනක් එවූ ඖරංසෙබ් සාමය වෙනුවෙන් සාකච්ඡා කිරීම සඳහා ඩෙකෑන් වෙත පැමිණීමට ආරාධනා කර සිටියේ ය. එහෙත් තම පියාට අත් වූ ඉරණම සිහිපත් කළ ගුරු ගෝබින්ද් විසින්


ඖරංසෙබ්ගේ ඇරයුම ප්‍රතික්ෂේප කරනු ලැබුවේ මීට පෙර ද ඇතිකරගනු ලැබූ එකගතා මෝගල්වරුන් කඩකළ අන්දම පිළිබඳ සවිස්තර තොරතුරු ඇතුළත් කළ 'සෆර්නාමහ්' නමින් හැඳින්වූ සන්දේශය මගිනි. පසුව තල්වන්දිහි රැඳී සිටි ගුරු ගෝබින්ද් අත්අඩංගුවට ගැනීමට වසීර් ඛාන් නම් මෝගල් නිලධාරියා අපේක්ෂා කළ ද, ගුරු ගෝබින්ද්ගේ සන්දේශය කියවූ ඖරංසෙබ් ගුරු අත්අඩංගුවට ගැනීම තහනම් කිරීමට වහාම පියවර ගත්තේ ය. එසේම ගුරු ගෝබින්ද් මුණගැසීමේ අපේක්ෂාව ඖරංසෙබ් නැවතත් දන්වූ හෙයින් අධිරාජයා මුණගැසීමට ඩෙකැන් බලා පිටත්වුණු ගුරුට අධිරාජයා මුණගැසීමට නොහැකිවූයේ වර්ෂ 1707 මාර්තු මාසයේදී ඖරංසෙබ් මියගිය හෙයිනි (*The New Encyclopaedia Britannica Vol. 27*, 2010:287A).

අනතුරුව මෝගල් සිහසුන සඳහා ඖරංසෙබ්ගේ දරුවන් තිදෙනා අතර ඇතිවූ සටනේදී මුඅසාම් කුමරු ගුරු ගෝබින්ද්ගේ සහය අපේක්ෂා කළ අතර එකී ඉල්ලීම අනුව තම උපරිම සහය ඔහුට ලබාදීමට ගුරු තීරණය කළේ ය. අවසානයේදී සිහසුන හිමිකරගත් මුඅසාම් මෝගල් සිහසුනට පත්වූයේ බහදූර් ෂා (1707-1712) යන නමිනි. වර්ෂ 1707 ජූලි 23 වනදා බහදූර් ෂා අධිරාජයා හා ගුරු ගෝබින්ද් සිං අතර අග්‍රාවේ පැවති හමුවේදී 'හින්ද්-කා-පිර්' හෙවත් 'ඉන්දියාවේ ශාන්තුවරයා' යන විරුදය මෝගල් අධිරාජයා විසින් ගුරු ගෝබින්ද්ට පිරිනමන ලදී. මේ අන්දමින් සීක් මෝගල් සබඳතා සුහදශීලී මට්ටමකට පත්කරගැනීමට ගුරු ගෝබින්ද්ට අවසානයේදී හැකියාව ලැබිණි (http://www.sikhiwiki.org/index.php/Guru_Gobind_Singh).

පසුව සීක් දහමේ ව්‍යාප්තිය උදෙසා සම්පූර්ණ කාලය කැප කළ ගුරු ගෝබින්ද් වරක් ගෝධාවරී ගංගා ප්‍රදේශයට ගිය අවස්ථාවකදී හමු වූ මදෝ දාස් නම් තවුසා බල්සාවට ඇතුළත් වීමට කැමැත්ත පළ කළ හෙයින් ඔහුව භක්ෂි සිංහ නමින් බල්සාවට ඇතුළත් කරගන්නා ලදී. පසුව බන්දා සිං නමින් ප්‍රකට වූ ඔහු ගුරු ගෝබින්ද්ගෙන් පසුව සීක්වරුන් මෙහෙයවීමට කටයුතු කළේ ය. මේ වන විට සියල්ල සුහදායී අන්දමින් පැවතුණ ද, තම පුත්‍රයන් මරා දැමූ සිර්හින්ද් පාලක වසීර් ඛාන් සමග බහදූර් ෂා පවත්වන සබඳතා පිළිබඳ ගුරු ගෝබින්ද් කළකිරීමෙන් පසු වූ අතර වසීර් ඛාන් විසින් රහසේ සීක්වරුන්ට එරෙහිව සිදුකරන පහරදීම් ද ක්‍රමයෙන් වැඩිවෙමින් පැවතිණි. මේ අතරවාරයේදී සීක්වරුන්ගේ හිතවතෙකු වූ පිරි බුදා ෂාහ් කැරලිකරුවෙකු වශයෙන් නම්කොට මරා දැමීමට වසීර් ඛාන් කටයුතු කිරීම පිළිබඳ ගුරුගේ අප්‍රසාදය මෝගල් අධිරාජයාට දැනුම් දුන්න ද, ඊට පිළිතුරක් නොලැබීමෙන් මෝගල් සීක් සබඳතාවලට එල්ලවූයේ අහිතකර බලපෑමකි (*The New Encyclopaedia Britannica Vol. 27*, 2010:287A).

එවන් පසුබිමක සීක්වරුන්ට එරෙහිව මෝගල් ප්‍රහාරයක් එල්ලවන බවට පුවතක් පැතිරයාමත් සමග සේනා සංවිධානය කළ ගුරු ගෝබින්ද් විසින් බල්සාවේ අණ දෙන නිලධාරියා වශයෙන් පත්කරනු ලැබුවේ බන්දා සිංව ය. මේ වන විට ගුරුගේ සතුරා වූ වසීර් ඛාන් ගුරු ඝාතනය කිරීම සඳහා කුමන්ත්‍රණ කරමින් සිටි අතර ඒ සඳහා යොදාගැනුණේ පඨාන් ජාතිකයන් වූ ජම්ෂෙඩ් ඛාන් හා වසිල් බෙග් යන දෙදෙනා ය. පළමුව ගුරුගේ

ගෝලයන් බවට පත් වූ සාතකයෝ නන්දෙද්හිදී සවස යාඥාවෙන් පසු විවේක ගනිමින් සිටි ගුරු ගෝබින්ද්ගේ හදවත ආසන්නයටම පිහියෙන් ඇනීමට සමත්වූහ. දරුණු තුවාල ලබා තිබුණ ද තම කඩුවෙන් ජම්ෂෙඩ් මරාදැමීමට ගුරු ගෝබින්ද්ට හැකි වූ අතර පලායන්නට තැත් කළ වසිල් බෙග් මරාදැමීමට එතැනට පැමිණි ගුරුගේ ආරක්ෂකයන්ට හැකිවිණි (http://www.sikhiwiki.org/index.php/Guru_Gobind_Singh).



**ඡායාරූපය 4 - ශ්‍රී ගුරු ග්‍රන්ථ් සහීබ් නම් ග්‍රන්ථය**

(http://www.sikhiwiki.org/index.php/Guru_Granth_Sahib)

ගුරු ගෝබින්ද් තුවාල ලැබූ බව සැලවීමත් සමග බහදූර් ෂා අධිරාජයා යුරෝපීය ශල්‍ය වෛද්‍යවරයෙකුගේ සේවය ගුරු වෙනුවෙන් ලබාදීමට කටයුතු කළ නමුත් තුවාලයෙන් අධිකව ලේ වහනය වන හෙයින් තමාගේ අවසානය ආසන්න බව ගුරු ගෝබින්දට වැටහී තිබිණි. මෙනිසා ගුරු නානක්ගේ සිට පැවත ගෙන ආ පුද්ගල ගුරු භාවය අහෝසි කළ ගුරු ගෝබින්ද් විසින් එතැන් පටන් සීක්වරුන්ගේ ගුරු බවට පත්වන්නේ සීක්වරුන්ගේ ශුද්ධ ග්‍රන්ථය වූ ආදි ග්‍රන්ථ් සහීබ් බව ප්‍රකාශ කරන ලදී (පින්තු, 2002:212) (ඡායාරූපය 4). එතැන් පටන් 'ගුරු ග්‍රන්ථ් සහීබ්' නමින් හැඳින්වුණු එම ග්‍රන්ථය සීක්වරුන්ගේ ආධ්‍යාත්මික ගුරු වශයෙන් සැලකිය යුතු බවට නියම කළ ගුරු ගෝබින්ද් සිං වර්ෂ 1708 ඔක්තෝබර් 7 වනදා මියගිය අතර ඔහුව ආදාහනය කළ ස්ථානයේ 'තක්ත් ශ්‍රී හසූර් සහීබ්' නමින් ස්මාරකයක් ඉදි කෙරිණි (http://www.sikhiwiki.org/index.php/Guru_Gobind_Singh).

මෙලෙස ගුරු ගෝබින්ද් සිං පුද්ගල ගුරු භාවය අහෝසි කළේ ඇයිදැයි යන පැනයට විවිධ අදහස් පළවන අතර පාරම්පරික ගුරුගේ උරුමය පවත්වාගෙන යාමට සිටි ගුරු ගෝබින්ද්ගේ පුත්‍රයන් සිව්දෙනාම අකාලයේ මියගොස් සිටීම ඒ සඳහා බලපෑ බවට මත පළවේ. එසේම ගුරු ගෝබින්ද් ඇවෑමෙන් ගුරු ධූරය පැවරීමට තරම් මධ්‍යස්ථ හා සැමදෙනාගේම පිළිගැනීමට පාත්‍ර වූ අයෙකු නොසිටීම ද ඊට හේතුවක් වූ බව කියැවේ (http://www.sikhiwiki.org/index.php /Guru_Gobind_Singh).

දක්ෂ රණශූරයෙකු සහ පාලකයෙකු වූ ගුරු ගෝබින්ද් සිං මියයාමට පෙර සීක්වරුන්ගේ අනාගතය උදෙසා ශක්තිමත් පදනමක් ඛල්සාව තුළින් ඇති කර තිබූ අතර දක්ෂ ලේඛකයෙකු, කවියෙකු වශයෙන් ප්‍රකට වූ ඔහු 'වාචිත්‍ර නාටක්' නම් ස්වයං ලිඛිත චරිතාපදානයක් ද, 'ජප් සහීබ්' නම් ග්‍රන්ථය ද, ඖරංසෙබ්ට පර්සියන් බසින් ලියූ ලිපි ඇතුළත් 'ශෆාර් නමාහ්' සන්දේශය සහ තමන්ගේ දේශනා ඇතුළත් 'දශම් ග්‍රන්ථ්' නම් ග්‍රන්ථය ද රචනා කර තිබිණි (පින්තු, 2002:213).



**ඡායාරූපය 5 - සීක් ගුරුවරුන් දස දෙනා දක්වෙන පැරණි සිතුවමක්**

(https://en.wikipedia.org/wiki/Guru_Nanak)

### සීක් ගුරුවරුන්ගේ පසු සීක් දහමේ ව්‍යාප්තිය

ගුරු ගෝබින්ද් සිං ඇවෑමෙන් සීක්වරුන්ගේ ලෞකික නායකයා වශයෙන් ක්‍රියා කළ බන්දා සිං, ගුරු සහ ගුරුගේ පුත්‍රයන් ඝාතනය කිරීමේ පළිය ගනිමින් වසීර් ඛාන් ඝාතනය කිරීමට සමත් වූ අතර මේ සටන්වලදී මුස්ලිම්වරුන් දරුණු අන්දමින් ඝාතනය කිරීමට සීක්වරුන් පොළඹවන්නේ ද එකී පළිගැනීමේ අරමුණු බව පෙනේ (සිංහ, 2005:472).

එහෙත් සීක්වරුන්ගේ මෙම කැරලිකාරී ස්වභාවයෙන් කලබලයට පත් බහදූර් ෂා අධිරාජයා විසින් මෝගල් සේනා පිටත්කොට බන්දා සිං ඇතුළු පිරිස අත්අඩංගුව ගෙන දිල්ලියේදී හිසගසා මරා දැමීමට නියම කරන ලදී. බන්දා සිං මරාදැමීමෙන් පසු භායි මාන් සිං නම් සීක් නායකයා වටා එක්වුණු සීක්වරු නැවතත් මෝගල්වරුන් සමග සටන් ඇරඹූ අතර මෝගල් පාලනය දුබල කිරීමට ඔවුන්ට හැකිවිණි. අවසානයේදී ඇෆ්ඝන් ආක්‍රමණ හේතුවෙන් මෝගල් බලය දෙදරා යාමත් සමග නැවතත් ශක්තිමත් වීමට සීක්වරු සමත්වූහ. අනතුරුව

සීක්වරුන් මර්දනය කිරීමට ඇෆ්ඝන් නායකයන් පෙළඹුණ ද එය සාර්ථක නොවුණි (සිංහ, 2005:473).

දහඅටවන සියවස අග භාගය වන විට 'මිසල්' නමින් හැඳින්වෙන ප්‍රාදේශීය බල මණ්ඩල දොළහක් යටතේ සීක්වරුන් සංවිධානය වී සිටි අතර බලවත් සීක් නායකයෝ දොළොස් දෙනෙක් එහි පාලන බලය ඉසිලූහ (සිංහ, 2005:473). ඉන් රංජිත් සිං නම් සීක් නායකයා විසින් පාලනය කරනු ලැබූ ප්‍රදේශය ක්‍රමයෙන් බලවත් වූ අතර අවසානයේදී ඔහුගේ නායකත්වයෙන් සීක් අධිරාජ්‍යයක් බිහිවිය. එහෙත් රංජිත් සිං ඇවෑමෙන් බලයට පත් සීක් පාලකයන් පරාජය කරමින් දියත් කෙරුණු උපායශීලී ක්‍රියාකාරකම් හේතුවෙන් සීක් ප්‍රදේශ සියල්ල අල්ලාගැනීමට අවසානයේදී ඉංග්‍රීසීහු සමත් වූහ (විජේතුංග, 2006:165).

**සමාලෝචනය**

පසළොස්වන සියවසේ ඉන්දියාව පුරා පැතිර ගිය භක්තිවාදයේ ප්‍රතිඵලයක් ලෙස හින්දු මුස්ලිම් ජනවර්ග අතර සංහිඳියාව ඇතිකිරීමේ අරමුණින් ආරම්භ වූ සීක් දහම මුල්කාලීනව සීඝ්‍රයෙන් පැතිර ගියේ අවිහිංසාවාදය පෙරටු කොටගෙන ය. ක්‍රමයෙන් ව්‍යාප්ත වූ සීක් දහම ඇදහූවන් පසුකලෙක වෙනම වර්ගයක් වශයෙන් හැඳින්වෙන්නට වූ අතර එවකට සමාජයේ පැවති කුල භේදය, අන්තර් ආගමික ගැටුම් ආදිය පිටුදැකීමට සීක් දහමින් අනගි පිටුබලයක් ලැබී තිබුණි. එහෙත් පසුකලෙක සීක් දහමට රණකාමීත්වයක් ආරෝපණය කෙරුණේ ඔවුන්ට බාහිරින් එල්ල වූ අභියෝගවල ශක්තිමත් මුහුණදීමේ අවශ්‍යතාව පැන නැගුණු හෙයිනි.

දිගින් දිගටම සීක්වරුන්ට එල්ල වූ බාහිර බලපෑම් හේතුවෙන් වඩාත් ශක්තිමත් අඩිතාලමක් සීක් දහමට දැමීම සඳහා පුරෝගාමී වූයේ අවසන් ගුරුවරයා වූ ගුරු ගෝබින්ද් සිං ය. 'ඛල්සා' නම් සංස්ථාව ස්ථාපනය කරමින් සීක්වරුන්ට නව ජවයක් මෙන්ම ප්‍රතිපදාවක් හඳුන්වාදෙමින් අභිමානවත් ජන වර්ගයක් බවට පත්කිරීම ගුරු ගෝබින්ද් සිං සමත් විය.

මුල්කාලයේදී සුදුසුකම් තිබූ අයෙකුට හිමි වූ ගුරු තනතුර කල්යත්ම පාරම්පරික තනතුරක් බවට පත් වූ අතර ගුරු ගෝබින්ද් සිං විසින් එකී පුද්ගල ගුරු භාවය අහෝසි කිරීම විශේෂ අවධානයකට යොමු කළ යුතු සිදුවීමකි. ඔහුගේ පුතුන් සිව්දෙනාම මියගොස් සිටීම හා ගුරු තනතුර සඳහා වෙනත් සුදුස්සෙකු නොසිටි හෙයින් සීක් දහමේ සුරක්ෂිත භාවය උදෙසා සීක්වරුන්ගේ ශුද්ධ ග්‍රන්ථය වෙත ගුරු තනතුර පැවරීම සාධනීය සිදුවීමකි. බුදුන් වහන්සේ ද පිරිනිවන් පෑමෙන් පසු තමන් වහන්සේ විසින් දේශනා කළ ධර්මය ගුරු තනතුරේ තබාගත යුතු බව වදාළ අතර ඒ අනුව යමින් ගුරු ගෝබින්ද් සිං ආදි ග්‍රන්ථ් සහිබ් වෙත ගුරු තනතුර පැවරීමෙන් සීක්වරුන්ගේ එකමුතුභාවය සුරක්ෂිත වූවා පමණක් නොව එය සීක්වරුන්ගේ අධ්‍යාත්මික වර්ධනය පිණිස ද රුකුලක් වූ බව කිව හැකිය. වර්තමානය දක්වා සීක් දහමේ ව්‍යාප්තියට සහ සීක්වරුන්ගේ එකමුතුභාවයට සීක් ගුරුවරුන්ගේ දේශනා ඇතුළත් ගුරු ග්‍රන්ථ් සහිබ් ලබාදෙන්නේ මහත් ආලෝකයක් බව පෙනෙන්නට තිබේ.

**ආශ්‍රිත මූලාශ්‍රය**

පින්තු, ක්ෂාවියර් සහ මියාල්, ඊ.ජී. (2002), *ඉතිහාස ධාරා I කාණ්ඩය*, ඉලංගසිංහ, මංගල (අනු.), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.

විජේතුංග, ඩබ්ලිව්.එම්.කේ. (2006), *මුගල් ඉන්දියාව*, සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.

සිංහ, නරේන්ද්‍ර කෘෂ්ණ සහ බැනර්ජි, අනිල් චන්ද්‍ර (2005), *ඉන්දියා ඉතිහාසය II කාණ්ඩය*, එරත්න, ඊ.ආර්. සහ කැකුලාවල, ඇස්.ඇල්. (අනු.), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.

*Collier's Encyclopedia Vol. 21* (1984), Halsey, William D. & Friedman, Emanuel (Ed.), Macmillian Educational Company, New York.

*Encyclopaedia Asiatica Vol. VIII* (1982), Balfour, Edward (Ed.), Cosmo Publications, New Delhi.

*The New Encyclopaedia Britannica Vol. 27* (2010), Safra, Jacob E, Aguilar-Cauz, Jorge & others (Ed.), Encyclopaedia Brittanica Inc., USA

http://www.sikhs.org/

http://www.sikhiwiki.org/

https://sites.google.com/site/akalpurakh/mayarchive

https://en.wikipedia.org/wiki/Sikh